**ශීර්ෂය 199 – ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශිර්ෂය 199 - ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 25 ක් දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.13 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන වලට අනුකූලව ඉටුකිරීමේදී

අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.3 |
| | | 2. තත්කාර්ය අග්‍රිම පියවීමේ ප්‍රමාදයන් | 2.9 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.10 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ අඩුපාඩු | 2.6 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.12 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන් | 2.1.2(ආ) |
| | | 2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2(ඇ) |
| | | 3. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම | 2.2 |
| | | 4. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3 |
| | | 5. මුදලට අගය විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු | 2.6 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ | 1. ඉන්ධන දහනය නොකිරීම. | 2.4(අ) |
| | | 2. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම | 2.4(ඇ) |

| | | | |
|---|---|---|---|
| | තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 3. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ දුර්වලතා | 2.7 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම<br>2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.8(අ)<br>2.8(ආ) |

## 2. ප්‍රමාණාත්මක සහ වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

### 2.1.1 සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාත්මක කාල රාමුව (Time Schedule) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තුකර ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

(i) කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම සහ ප්‍රාථමික කර්මාන්ත අංශ සංවර්ධනය යටතේ මාතර, ගාල්ල, අම්පාර යන කෘෂිකර්ම කලාප 03 කට සහ ඔලුවිල්, කල්පිටිය, මන්නාරම ඇතුලත්වන පරිදි ධීවර කලාප 02 කට කෘෂිකර්ම සැකසුම් කලාප පිහිටුවීම සඳහා රු.මිලියන 105 ක් ද, වවුනියා හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල ආදර්ශ සැකසුම් කලාප පිහිටුවීමට රු.මිලියන 10 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 115 ක් වෙන්කර තිබුණද, වර්ෂය තුලදී කිසිදු කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ii) ප්‍රාථමික කර්මාන්ත අංශ සංවර්ධනයට අවශ්‍ය පරිසරය සකස් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සීමිත සම්පත්වල තිරසර බව සහතික කර ගැනීමේ මූලික කටයුතු සඳහා රු.මිලියන 04 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර, එම කටයුතු ඉටුකර නොතිබුණි.

(ආ) **ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

අමාත්‍යාංශය සිය අරමුණුවලට අදාල කාර්යයවලින් බැහැරව කෑගල්ල දිස්ත්‍රික්කයේ ගංවතුර හා නාය යාම හේතුවෙන් විනාශ වූ මාර්ග සංවර්ධන කටයුතු සහ අම්පාර දිස්ත්‍රික්කයේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගලපාමුල අමුණ ඉදිකිරීම සඳහා එකතුව රු.මිලියන 57.25 ක් වැයකර තිබුණි.

(ඇ) **අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23 ක ප්‍රතිපාදන මත ධීවර අපනයන අධි කලාප පිහිටුවීම සඳහා මුහුදු බෝට්ටු 20 ක්, දැල් 750 ක්, ඔරු 125 ක්, මිලදී ගැනීමට හා බෙල්ලන් ඇති කරන මුහුදු උද්‍යාන 03 ක් නිර්මාණය කිරීමට, සැලසුම් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 18.90 ක් වැයකර තිබුණි. දැල් 150 ක්, ඔරු 79 ක්, මිලදී ගෙන නොතිබුණු අතර බෙල්ලන් ඇති කරන මුහුදු උද්‍යාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) ප්‍රධාන ක්‍රියාකාරකමක් වූ අගයදාම නිෂ්පාදන සැලසුම් කලාප ඇති කිරීම යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සැකසුම් කලාපයක් පිහිටුවීම සඳහා රු.මිලියන 19 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර, වර්ෂය අවසානවන විට රු.මිලියන 1.20 ක් වැයකර මූලික කටයුතුවලට අදාලව ශක්‍යතා වාර්තා සකස් කිරීම, සැලසුම් සකස් කිරීම, ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම ඇතුළු මූලික කාර්යයන් කිහිපයක් පමණක් සිදුකර තිබුණි.

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, මුදල් වර්ෂය අවසාන වී දින 248 කින් පසුව 2018 සැප්තැම්බර් 06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

## 2.2 ක්‍රියාත්මක කර තිබුණු විදේශ ආධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් කෘෂිකාර්මික හා අපනයන කෘෂි නිෂ්පාදන ක්ෂේත්‍රයේ අගය එකතු කළ නිෂ්පාදන සඳහා කුඩා පරිමාණ නිෂ්පාදන ආයතන හා කෘෂි ව්‍යවසායකයින් දිරි ගැන්වීම, ආයෝජන කෙරෙහි ආකර්ශණය කර ගැනීම හා වැඩිදියුණු කිරීම තුළින් වාණිජමය සහ අපනයනාභිමුඛ කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් විදේශ ආධාර ව්‍යාපෘතියක් 2016 ඔක්තෝබර් 15 දින ක්‍රියාත්මක කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දින නිම වීමට නියමිත විය. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 750 ක ප්‍රතිපාදන මේ සඳහා වෙන්කර තිබුණු අතර, ඉන් රු.මිලියන 335 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන ගැලපුම් ප්‍රධාන වැඩසටහන යටතේ ඉහළ දරිද්‍රතාවයෙන් යුතු යාපනය, මඩකලපුව, අනුරාධපුර, මුලතිව්, මොණරාගල, මාතලේ හා පොලොන්නරුව යන දිස්ත්‍රික්ක හතක් තුල ගොවි නිෂ්පාදන සංවිධාන 350 ක් සඳහා සහයෝගය දැක්වීමට අපේක්ෂා කර තිබුණු නමුත්, රු.මිලියන 46.91 ක වියදමින් මෙම වැඩසටහන හඳුන්වා දී තිබුණේ ගාල්ල සහ කොළඹ යන දිස්ත්‍රික්ක සඳහා පමණි.

(ආ) ව්‍යාපෘතිය ආරම්භ වී වර්ෂයක කාලයක් ඉකුත් වී ඇතත්, ණය ඇපවීමේ ක්‍රියාකාරකම් සඳහා වෙන්කරන ලද රු.මිලියන 7.12 ක මුදල උපයෝජනය කර නොතිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබාගැනීම

### 2.3.1 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයුම් හා සේවා ඉටුකර ගැනීම සඳහා රු.මිලියන 864.80 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 217.55 ක් පමණක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදන සම්බන්ධයෙන් පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අන්නාසි පැළ මිලදී ගැනීමට, සත්ත්ව ගොවිපල ව්‍යාපෘතිය සඳහා සහ කුරුදු පර්යේෂණ වැඩසටහන සඳහා එකතුව රු.මිලියන 160 ක් ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා තිබුණද මෙම ප්‍රසම්පාදනයන් සිදුකර නොතිබුණි.

(ආ) එකතුව රු.මිලියන 6.14 ක වියදමින් විදුලි සකපෝරු යන්ත්‍ර 54 ක්, රජ වැවෙහි මසුන් බෝ කිරීම සඳහා අවශ්‍ය උපකරණ සහ පරිගණක උපාංග මිලදීගෙන තිබුණද, මේ සඳහා ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය භාවිත කල වාහන 16 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී හා පසුගිය වර්ෂව තුලදී ඉන්ධන දහනය වීම් පරීක්ෂා කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, 2018 සැප්තැම්බර් 30 දින වන විටත්, එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන 08 ක් සතු වාහන 10 ක් අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අතර, 2018 අගෝස්තු 31 දින වන විටත්, එම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෘෂි සේවා මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණින් අමාත්‍යාංශය විසින් රු.මිලියන 30.84 ක් වැයකර උස අතු කපන යන්ත්‍ර, වලවල් කැපීමේ යන්ත්‍ර, අධි පීඩන දියර ඉසීමේ යන්ත්‍ර හා වල්

කපන යන්ත්‍ර එක් වර්ගයකින් 375 බැගින් මිලදී ගැනීම සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැඩසටහනේ මූලික අරමුණ වන අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නියැලී සිටින ගොවීන්ට උපකරණවලින් සේවා සැලසීම වුවත්, අදාල යන්ත්‍ර හතරම අඩංගු කට්ටලය එක් ප්‍රතිලාභියකුට ලබාදීමෙන් එක් කාල පරිච්ඡේදයක් තුල මෙම සියළු යන්ත්‍රවලින් එක විට සේවා සලසා ගැනීමට නොහැකි වීම අදාල අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් වී තිබුණි.

(ii) අදාල වැඩසටහන සඳහා ආයෝජන ඇස්තමේන්තුව සකස් කිරීමේදී ප්‍රතිලාභ ලබාදෙන ගොවීන් විසින් කෘෂිකර්ම කටයුතු සඳහා අවශ්‍ය වෙනත් උපකරණ වන කැති, උදළු, අලවංගු වැනි අත් උපකරණ වර්ග 14 ක් මිලදී ගෙන එම රිසිට්පත් ඉදිරිපත් කිරීමෙන් පසු අදාල යන්ත්‍ර උපකරණ හතර ලබාදීම සඳහා සුදුස්සකු වන බවට නිර්ණායකයක් සකස්කර තිබුණද මෙතෙක් උපකරණ කට්ටල බෙදා දී ඇති ප්‍රතිලාභීන් 112 දෙනාම මෙසේ අත් උපකරණ මිලදී ගෙන රිසිට්පත් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී මිලට ගත් රු.මිලියන 21.63 ක් වටිනා යන්ත්‍ර අතරින් උස් අතු කපන යන්ත්‍ර, වල් කපන යන්ත්‍ර, අධි පීඩන දියර ඉසින යන්ත්‍ර හා වලවල් කපන යන්ත්‍ර කට්ටල 263 බැගින් 2018 සැප්තැම්බර් 15 දින වන විටත්, අදාල ප්‍රතිලාභීන්ට බෙදා දීමට කටයුතු කර නොකර දිස්ත්‍රික් අපනයන කෘෂිකර්ම කාර්යාලවල ගබඩාකර තිබුණි.

(ආ) මී පැණි නිෂ්පාදන ව්‍යාපෘතියක් යටතේ රු.මිලියන 19.46 ක් වැයකර මී මැසි පෙට්ටි 12000 ක් සහ ඊට අවශ්‍ය උපකරණ මිලදීගෙන බෙදා හැරීමට සැලසුම් කර තිබුණු අතර, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට මාස 05 කට අධික කාලයක් ප්‍රමාද කර තිබුණි. ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සති 08 ක් ඇතුළත පෙට්ටි තොගය සපයා නොතිබුණු අතර, 2018 මැයි 31 දින වන විට මී මැසි පෙට්ටි 3753 ක් පමණක් සැපයීම නිසා එදින මී මැසි පෙට්ටි සැපයීමේ ගිවිසුමෙන් ඉවත්වීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණි.

## 2.6 මුදලට අගය විගණනය

සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ විදේශ ගමන් පිළිබඳ සිදුකල නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) 2006 පෙබරවාරි 21 දිනැති අංක සීඑල්ඒ/2/3/4 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ 2.2.2 සහ 2.7.1 ඡේද ප්‍රකාරව එතෙර පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය දූත මණ්ඩල හෝ විදේශීය රාජ්‍යයන්හි අමාත්‍යාංශය සමඟ සෘජුව සබඳතා පවත්වමින් නිල හෝ නිල නොවන චාරිකා යොදා නොගත යුතු බවත්, පෞද්ගලික මට්ටමින් ලැබෙන ආරාධනා සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කල යුතු බවත්, එම නිල ගමන් සංඛ්‍යාව 05 ක් නොඉක්මවිය යුතු බවත්, සඳහන් කර තිබුණද අමාත්‍යවරයා සහ එහි නිළධාරීන් අවස්ථා 10 කදී පෞද්ගලික මට්ටමින් ලැබෙන ආරාධනා සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවසරය ලබානොගෙන විදේශ ගත වීම වෙනුවෙන් රු. 9,848,379 ක් වැයකර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 4 ඡේදය අනුව අමාත්‍යවරුන් විදේශ සංචාරයකින් පසුව දිවයිනට පැමිණ සති 02 ක් ඇතුළත නිළ කාර්යයන් සහ චාරිකාව හේතුවෙන් රටට ලැබිය හැකි ප්‍රතිලාභ හා නිරීක්ෂණ සහිතව අමාත්‍ය මණ්ඩලයට, වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යවරයා සහභාගී වූ විදේශ සංචාර සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ චීනයේ ගුවැන්ගේෂෝහි පැවැත්වූ වෙළඳ ප්‍රදර්ශනයේ හා මත්ස්‍ය තරඟාවලියේ සංවිධාන කටයුතු සඳහා සහභාගිවූ කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතියේ නිලධාරියකුට 2015 මැයි 15 දිනැති අංක 02/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ විධි විධාන අනුව අනියම් දීමනාව ලෙස දිනකට ඇ.එ.ජ ඩොලර් 40 බැගින් ගෙවීම වෙනුවට ඇ. එ. ජ.ඩොලර් 75 බැගින් දින 08 ක් සඳහා ඇ.එ.ජ. ඩොලර් 600 ක් ගෙවා තිබුණි.

(ඈ) 2010 ජූලි 09 දිනැති අංක සීඒ/1/1/16/1 ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිලධාරීන් විදේශ සංචාරය නිමවා ආපසු දිවයිනට පැමිණ දින 07 ක් තුල ගමන සම්බන්ධයෙන් ඉදිරිපත් කල යුතු (ඊ) ඇමුණුමේ ඇති ආකෘතිය අනුව වාර්තාව විදේශ ගමන අනුමත කල නිලධාරියා වෙත ඉදිරිපත් කල යුතුබව දක්වා තිබුණද විදේශ සංචාර 09 කදී සහභාගී වූ නිලධාරීන් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2015 මැයි 15 දිනැති අංක 01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 07(අ) ඡේදය පරිදි නිළධාරීන් විදේශගතවීම්වලදී කරන දීමනා ගෙවීම් වියදමක් වශයෙන් ගිණුම්ගත කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ නිළධාරින් 15 දෙනෙකුට අවස්ථා 27 කදී විදේශගත වීමේදී කර තිබුණු රු.මිලියන 6.60 ක දීමනා ගෙවීම්, අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 2.7 මහජනයා වෙත සේවය ඉටු කිරීම

-----------------------------------

අමාත්‍යාංශය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර තිබුණද ඒ හරහා මහජනයාගෙන් පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙලකර නොතිබුණි. අමාත්‍යාංශය තුල මහජන පැමිණිලි භාර ගැනීම සඳහා පැමිණිලි පෙට්ටියක් පරිහරණය නොකරන අතර, පැමිණිලි භාර ගැනීම සඳහා ලේඛනයක් පවත්වා ගත්තද මෙය ප්‍රදර්ශනය කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

## 2.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

----------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 03 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2015 | පුනරාවර්තන | 28.355 | 20.865 | 7.490 | 26.42 |
| | මුලධන | 13.050 | 11.257 | 1.793 | 13.74 |
| | **එකතුව** | **41.405** | **32.122** | **9.283** | **22.42** |
| 2016 | පුනරාවර්තන | 182.230 | 111.005 | 71.225 | 39.06 |
| | මුලධන | 205 | 176.264 | 28.736 | 14.02 |
| | **එකතුව** | **387.230** | **287.269** | **99.961** | **25.81** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2017 | පුනරාවර්තන | 147.147 | 141.085 | 6.062 | 4.12 |
| | මූලධන | 1,763.800 | 471.566 | 1,292.234 | 73.26 |
| | **එකතුව** | **1,910.947** | **612.651** | **1,298.296** | **67.94** |

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

ප්‍රාග්ධන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 50.35 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 14 ක් සඳහා එකතුව රු.මිලියන 1,715.04 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 471.27 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 2.9 අග්‍රිම ගිණුම

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්ය නිමකර දින 10 ක් ඇතුලත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කල යුතු වුවත්, අමාත්‍යාංශයේ නිළධාරීන් 14 දෙනෙකු ලබාගෙන තිබුණු රු.677,541 ක තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම දින 10 ක සිට දින 235 ක් දක්වා ප්‍රමාද කර තිබුණු අවස්ථාවන් 36 ක් පැවතුණි.

## 2.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාරව පවත්වාගත යුතු රාජකාරී දුරකථන ලේඛනය සහ මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව පවත්වා ගත යුතු ඇප ලේඛනය පවත්වා නොතිබුණි.

## 2.11 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව** | | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (අ) | මුදල් රෙගුලාසි 104 (3) | 307,393 | සමාලෝචිත වර්ෂය තුල සිදු වූ අනතුරු තුනක් සම්බන්ධයෙන් පිළියෙල කර ඉදිරිපත් කල යුතු ප්‍රාරම්භක වාර්තා, අනතුරු සිදු වී වර්ෂයකට අධික කාලයක් ගත වී ඇතත් 2018 ඔක්තෝබර් 15 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 104(4) | 191,933 | සමාලෝචිත වර්ෂයේ වැන් රථයකට අවස්ථා දෙකකදී සිදු වූ අනතුරු සම්බන්ධයෙන් පිළියෙල කර ඉදිරිපත් කල යුතු පරිපූර්ණ වාර්තා 2018 අගෝස්තු 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 1646 | - | සමාලෝචිත වර්ෂයේ ධාවනය කල වාහන 07 කට අදාල ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**2.12 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

අමාත්‍යාංශයේ කායීභාරයන් ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්යමණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.44,267,230 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.790,486 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 08 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 39 | 25 | 14 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 18 | 01 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | 05 | 03 | 02 |
| | **එකතුව** | **81** | **56** | **25** |

**2.13 රජයේ නිලධාරීන්ට ඇප තැබීම**

මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරියකු ඇප තබා නොතිබුණි.